**ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව**
கடற்றொழில் நீரியல் வளத்துறை திணைக்களம்
DEPARTMENT OF FISHERIES & AQUATIC RESOURCES

web site : http://www.fisheriesdept.gov.lk E - mail : info@fisheriesdept.gov.lk
புதிய செயலகம், மாளிகாவத்தை, கொழும்பு 10, இலங்கை **නව මහ ලේකම් කාර්යාලය, මාලිගාවත්ත, කොළඹ 10, ශ්‍රී ලංකාව** New Secretariat,Maligawaththa, Colombo 10

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல<br>My Ref | ධීජදෙ/ආ02/02/ධීනි.බ.ගැ.<br>විවෘත IV වෙළුම | ඔබේ අංකය<br>உமது இல<br>Your Ref | | දිනය<br>திகதி<br>Date | 2026.08. 03 |

<u>**ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ (ආශ්‍රිත නිලධර සේවා ගණයේ) ධීවර නිලධාරී III ශ්‍රේණිය සඳහා විවෘත පදනමින් බඳවා ගැනීමේ තරග විභාගය -2024/2025**</u>

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2,443 දරන 2025.06.27 දිනැති ද අංක 2,370 හා 2024.02.02 දිනැති ද රජයේ ගැසට් පත්‍රවල පළ වූ නිවේදනයන්ට අනුව 2025.10.19 දින පවත්වනු ලැබූ මෙම දෙපාර්තමේන්තුවේ (ආශ්‍රිත නිලධර සේවා ගණය) ධීවර නිලධාරී III ශ්‍රේණිය සඳහා විවෘත පදනම මත බඳවා ගැනීමේ ලිඛිත තරග විභාගයේ සහ 2026.04.06,07,08,09 හා 10 යන දිනයන්හි දී පවත්වනු ලැබූ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ ප්‍රතිඵල මත **2026.08.24** වන දින සිට ක්‍රියාත්මක වන පරිදි ධීවර නිලධාරී III ශ්‍රේණියේ පත්වීමක් සඳහා සුදුසුකම් ලබා ඇති අයදුම්කරුවන්ගේ නාම ලේඛනය ඇමුණුම 01 මඟින් මේ සමඟ පළ කරමි.

02. ඒ අනුව පත්වීම් ප්‍රදානය කිරීමේ වැඩසටහන **2026 අගෝස්තු මස 19** වැනි දින **කොළඹ 10, ඩී.ආර්.විජේවර්ධන මාවතේ, නො.310** පිහිටි තැපැල් මූලස්ථාන ශ්‍රවණාගාරයේ දී පවත්වනු ලබන අතර එම පත්වීම් ප්‍රදානය කිරීමේ අවස්ථාව සඳහා සහභාගී වී පත්වීම භාරගන්නා ලෙස ඔබ වෙත කාරුණිකව දන්වමි.

03. **පත්වීම් ප්‍රදානය කිරීමේ වැඩසටහන සඳහා පැමිණීමට උපදෙස්:**

- සියලු පත්වීම්ලාභීන් පෙරවරු **8.30** වන විට ශාලාවේ අසුන් ගෙන සිටිය යුතු වේ.
- පත්වීම් ප්‍රදානය කිරීමේ වැඩසටහනට පැමිණීමේදී ඔබගේ අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා මෙම කැඳවීම් ලිපිය සහ ජාතික හැඳුනුම්පත, වලංගු රියදුරු බලපත්‍රය හෝ වලංගු විදේශ ගමන් බලපත්‍රය අනිවාර්යයෙන්ම රැගෙන ආ යුතු වේ.
- පත්වීම් ප්‍රදානය කිරීමේ වැඩසටහන පැවැත්වෙන පරිශ්‍රය තුළට ඇතුළු කරගනු ලබන්නේ **පත්වීම්ලාභියා පමණක්** වන බව සැලකිය යුතු වේ.
- මෙම අවස්ථාවට සහභාගීවන පිරිමි නිලධාරීන් කමිසය, කලිසම, ටයිපටිය හෝ ජාතික ඇඳුම ලෙස ද කාන්තා නිලධාරිනියන් සාරිය/ ඔසරිය ලෙස ද වශයෙන් රාජ්‍ය උත්සව අවස්ථාවකට ගැලපෙන වාම් ඇඳුමකින් සැරසී පැමිණිය යුතු වේ.
- පත්වීම් ප්‍රදානය කිරීමේ වැඩසටහන සම්බන්ධීකරණය කිරීමේ නිලධාරියාගේ තොරතුරු හා ගමන් මාර්ගය මෙම QR කේතය භාවිතා කර ලබා ගත හැක.

සුසන්ත කහවත්ත
අධ්‍යක්ෂ ජනරාල්
ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව

තැ.පෙ. / த.பெ.இ / P.O.Box } 531
පොදු දුරකථනය / பொது தொலைபேசி / Gen. Telephone } +94(0)112446183 (2 lines)
ෆැක්ස් / தொலைநகல் / Fax } +94(0) 112449170